# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2107/12 – 2019 ජනවාරි 22 වැනි අඟහරුවාදා – 2019.01.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, නිවිතිගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නවදුන් කෝරළේ, මැද පත්තුව සුළු කොට්ඨාසයේ, දොඹගම්මන (අ.ග.පි. 23) ගමේ පිහිටි මැනුම්පති විසින් පිළියෙල කරන ලද අංක ආර්/එන්වීටී/2013/520 හා 2013.12.17 දරන ප්‍රගමන අනුරේඛනයේ පහත නම් සහ ප්‍රමාණයෙන් යුක්ත වූ ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – කිරිබත්ගලවත්ත - දොඹගම්මන කොටස – ප්‍රමාණය: හෙක්. 8.0000**

උතුරට: මාර්ගය (ප්‍රාදේශීය සභා); නැගෙනහිරට: මාර්ගය (ප්‍රාදේශීය සභා) සහ අගලවත්ත වැවිලි සමාගම හිමිකම් කියන කිරිබත්ගලවත්ත - දොඹගම්මන කොටස; දකුණට: අගලවත්ත වැවිලි සමාගම හිමිකම් කියන කිරිබත්ගලවත්ත - දොඹගම්මන කොටස, ඉනෝකා කුමාරි ජයසුන්දර, රංජිත් විජේවර්ධන සහ තවත් අය හිමිකම් කියන කැබෙල්ලවත්ත; බටහිරට: ඉනෝකා කුමාරි ජයසුන්දර, රංජිත් විජේවර්ධන සහ තවත් අය හිමිකම් කියන කැබෙල්ලවත්ත සහ මාර්ගය (මා.සං.අ.).

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/15/2013/වීර්/143.
2018 ඔක්තෝබර් මස 05 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

02 – 232

1A – G 29290 – 16 (2019/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*